Department of Education, Sabaragamuwa Province/ Weekly School

**පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල**

විෂය - ආර්ථික විද්‍යාව

සතිය - අගෝස්තු - 4

ශ්‍රේණිය - 13

සකස් කළේ-රංජිත් ඥානසිරි මයා,ර/ගන්කන්ද මධ්‍ය විද්‍යාලය.

නිපුණතාව 9 - විදේශ වෙළෙඳාමේ න්‍යායාත්මක පදනම විග්‍රහ කරමින් විදේශ වෙළෙඳාම ශ්‍රී ලංකා ආර්ථිකය කෙරෙහි ඇති කරන බලපෑම ගවේෂණය කරයි.

නිපුණතා මට්ටම 9.1 - අන්තර්ජාතික වෙළෙඳාමට පදනම් වූ සාධක විමර්ශනය කරයි.

9.2 - ආරක්ෂණවාදී ක්‍රියාමාර්ග හා එමගින් නිදහස් වෙළෙඳාමට ඇති කරන බලපෑම විශ්ලේෂණය කරයි.

I. A රට උරුම කරගත් ශ්‍රම සම්පත් ප්‍රමාණය ඒකක 200ක් ද,B රට උරුම කරගත් ශ්‍රම සම්පත් ප්‍රමාණය ඒකක 200ක් ද වේ යැයි සලකන්න.එක් එක් රටෙහි X සහ Y යන භාණ්ඩ ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය කරන ශ්‍රම ඒකක ප්‍රමාණ පහත සඳහන් වගුවේ දැක්වේ.

| A රට | | B රට | |
|---|---|---|---|
| භාණ්ඩය | ශ්‍රම ඒකක | භාණ්ඩය | ශ්‍රම ඒකක |
| X | 5 | X | 4 |
| Y | 3 | Y | 8 |

(අ) එක් එක් රට සඳහා නිෂ්පාදන හැකියා වක්‍ර වෙන් වෙන්ව ඇඳ,ඒවා නිවැරදිව නම් කරන්න.

(ආ) එක් එක් රටට කවර භාණ්ඩයක් සඳහා නිරපේක්ෂ වාසි තිබේද?පිළිතුර පැහැදිලි කරන්න.

(ඉ) එක් එක් රටට කවර භාණ්ඩයක් සඳහා සාපේක්ෂ වාසි තිබේද?පිළිතුර පැහැදිලි කරන්න.

II. සාපේක්ෂ වාසි බිහි කෙරෙන ඕනෑම මූලාශ්‍ර දෙකක් සඳහන් කරන්න.
III. ගෙවුම් ශේෂ ලේඛනයක ජංගම ගිණුමෙහි ප්‍රධාන සංරචක නම් කරන්න.
IV. නාමික විනිමය අනුපාතිකය සහ සඵල විනිමය අනුපාතිකය අතර වෙනස දක්වන්න.
V. නිදහස් වෙළෙඳාමට පක්ෂව ඉදිරිපත් කෙරෙන තර්ක මොනවාද?